# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 ජූලි මස 24 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.07.27 දින නිකුත් කරන ලදී)

## දූෂණ විරෝධී (සංශෝධන)

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

ගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 65.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින්, (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ, කොමිෂන් සභාවට ස්ථිර හෝ තාවකාලික පදනම යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් හෝ පොලිස් බලකායේ නිලධරයන් බඳවා ගැනීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ කොමිෂන් සභාව විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට මහෙස්ත්‍රාත් අධිකරණවල ගොනු කරනු ලබන චෝදනා ඉල්ලා අස්කර ගැනීමට හැකියාව සැලසීමට අදාළව විධිවිධාන සැලසීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ අපසහයකයකුට සමාව දීම සඳහා III වන කොටසේ විධිවිධාන යටතේ චෝදනා ගොනු කරනු ලැබූ තැනැත්තකු වරද සම්බන්ධව ඔහුගේ දැනීම අනුව වූ අවස්ථාගත කරුණු සියල්ල පිළිබඳ සම්පූර්ණ වූ ද, සත්‍ය වූ ද, අනාවරණයක් සිදු කිරීමේ කොන්දේසිය මත එම තැනැත්තාට චෝදනා ගොනු නොකිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය දීම සඳහා කොමිෂන් සභාවට හැකියාව ලබා දීමට අවශ්‍ය විධිවිධාන සැලසීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ II වන කොටස අදාළ වන සෑම තැනැත්තකුට ම නියමිත වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදු කිරීමට හැකියාව ලබා දීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ සිංහල භාෂා පිටපතේ ඇති වරදක් නිවැරදි කිරීම වේ;

(2) රාජ්‍ය සංස්ථාවල මාණ්ඩලික නිලධරයන් ඇතුළත් කිරීම වේ;

(3) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ විධිවිධානය ඇතුළත් කිරීම වේ;

(4) ලියාපදිංචි සාමාජිකයන් ගණන දහසකට වඩා වැඩි සාමාජිකයන් සහිත වෘත්තීය සමිති සඳහා මේ වගන්තියේ විධිවිධාන අදාළ කිරීම වේ;

(5) රාජ්‍ය සේවකයා යන අර්ථ නිරූපණයට සිදු කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ;

(6) වගන්තිය නිශ්චිත කිරීම සඳහා සභාපතිවරු, අධ්‍යක්ෂවරු සහ මාණ්ඩලික නිලධරයන් ඇතුළත් කිරීම වේ;

(7) ජනමාධ්‍ය ආයතනවල හිමිකරුවන්ට, සභාපතිවරුන්ට සහ අධ්‍යක්ෂවරුන්ට වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ විධිවිධාන අදාළ කිරීම වේ; සහ

(8) ප්‍රධාන ප්‍රඥප්තියේ සිංහල භාෂා පිටපතේ ඇති වරදක් නිවැරදි කිරීම වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය එහි (ඉ) ඡේදය ඉවත් කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන තැනැත්තාට සම්පූර්ණයෙන් ම පිටස්තර පුද්ගලයන් වන තැනැත්තන් ඉවත් කිරීම මගින් එකී පිටස්තර තැනැත්තන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කිරීම වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රායෝගික අපහසුතාවයක් ඉවත් කර එය නිවැරදි කිරීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ බැඳියාවන් පිළිබඳ සට්ටනයන් සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීමට විධිවිධාන සැලසීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ මේ වගන්තියේ විධිවිධානවලට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා ඇතුළත් කිරීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ වගන්තියේ විධිවිධාන වඩාත් පැහැදිළිව දැක්වීම සහ වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදු කරන තැනැත්තන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කිරීම වේ.

***12 වන වගන්තිය :***මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය ඉවත් කර අලුත් වගන්තියක් ආදේශ කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ වගන්තියේ විධිවිධාන වඩාත් පැහැදිළිව දැක්වීම වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ වගන්තියේ විධිවිධාන වාර්ෂික ප්‍රකාශ හෝ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශ සම්බන්ධයෙන් අදාළ කිරීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ මේ වගන්තියේ විධිවිධාන ප්‍රධාන ප්‍රඥප්තියේ සියලු ම වගන්ති සඳහා අදාළ කිරීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ සිංහල භාෂා පිටපතේ ඇති වරදක් නිවැරදි කිරීම වේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 111 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ දූෂණ වරදක් සිදු කිරීම මගින් ලබා ගන්නා ලද හෝ පරිවර්තනය කරන ලද යම් දේපළක් හෝ අලාභයක් නැවත රජයට ලබා ගැනීම හෝ අය කර ගැනීම සහ දූෂණ වරදක් මගින් රජයේ සේවකයකු හෝ අන් තැනැත්තකු විසින් ලබාගත් යම් ප්‍රදානයක්, පත්වීමක්, ප්‍රතිලාභයක් හෝ වාසියක් අදාළ වරදකරු කිරීමේ දිනයේ සිට නීති විරෝධී කිරීම සඳහා විධිවිධාන සැළසීම වේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කර අලුත් උපවගන්තියක් ආදේශ කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම

වනුයේ රජයට රුපියල් ලක්ෂ පහකට නොඅඩු අලාභයක් සිදු කරන ලද තැනැත්තකු සම්බන්ධයෙන් ඇප පනතේ විධිවිධාන වෙනස් අයුරින් අදාළ කරවීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තියේ රජයේ සේවකයා සහ උපලේඛනගත ආයතනය යන අර්ථ නිරූපණ සංශෝධනය කරනු ලබන අතර, එය රජයේ සේවකයන් සහ උපලේඛනගත ආයතන සම්බන්ධයෙන් සිදු කරන ලද සංශෝධනයන්ට ආනුෂංගික වේ.

***19 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2023 සැප්තැම්බර් මස 15 වන දින සහ මේ පනත ක්‍රියාත්මක වන දින දක්වා අතරතුර කාලයේ දී කොමිෂන් සභාව වෙත බඳවා ගන්නා ලද යම් නිලධරයන්ගේ සහ සේවකයන්ගේ අයිතිවාසිකම් ඉතිරි කිරීම වේ.

එල්. ඩී. -ඕ. 7/2026

## 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1**. මේ පනත 2026 අංක  දරන දූෂණ විරෝධී (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2023 අංක 9 දරන පනතේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

**2**. (මෙහි මින් මතු ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (5) වන උපවගන්තියේ ‘‘රාජ්‍ය සේවයේ යම් නිලධරයකු විසින් එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ’’ යන වචන වෙනුවට ‘‘රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ පොලිස් බලකායේ යම් නිලධරයකු විසින් එම නිලධරයාගේ සහ අවස්ථාවෝචිත පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවේ’’ යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (6) වන  උපවගන්තියේ, ‘‘රාජ්‍ය සේවයේ යම් නිලධරයකු’’ යන වචන වෙනුවට ‘‘රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ පොලිස් බලකායේ යම් නිලධරයකු’’ යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (7) වන උපවගන්තියේ, ‘‘රාජ්‍ය සේවයේ යම් නිලධරයකු’’ යන වචන වෙනුවට ‘‘රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ පොලිස් බලකායේ යම් නිලධරයකු’’ යන වචන ආදේශ කිරීමෙන්.

PL 15849 - 465 (2026/07)

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ, “අධිචෝදනා ලබා ඇති තැනැත්තකුට එරෙහිව මහාධිකරණයක්” යන වචන වෙනුවට “අධිචෝදනා හෝ චෝදනා ලබා ඇති තැනැත්තකුට එරෙහිව මහාධිකරණයක් හෝ මහෙස්ත්‍රාත් අධිකරණයක්” යන වචන ආදේශ කිරීමෙන් සහ “මහාධිකරණයේ අවසරය මත ඒ චූදිතයාට එරෙහිව වන අධිචෝදනාව” යන වචන වෙනුවට “මහාධිකරණයේ හෝ මහෙස්ත්‍රාත් අධිකරණයේ අවසරය මත ඒ චූදිතයාට එරෙහිව වන අධිචෝදනාව හෝ චෝදනාව” යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ, “අධිචෝදනාවක්” යන වචන වෙනුවට “අධිචෝදනාවක් හෝ චෝදනාවක්” යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (3) වන උපවගන්තියේ, “අධිචෝදනාවක්” යන වචන වෙනුවට “අධිචෝදනාවක් හෝ චෝදනාවක්” සහ එහි (i) වන ඡේදයේ, “මහාධිකරණය ඉදිරිපිට දී” යන වචන වෙනුවට “මහාධිකරණය හෝ මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරිපිට දී” යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (4) වන උපවගන්තියේ, “මුල් අධිචෝදනාවේ” යන වචන වෙනුවට “මුල් අධිචෝදනාවේ හෝ මුල් චෝදනාවේ” යන වචන ආදේශ කිරීමෙන් සහ “අලුත් අධිචෝදනාවක්” යන වචන වෙනුවට “අලුත් අධිචෝදනාවක් හෝ අලුත් චෝදනාවක්”යන වචන ආදේශ කිරීමෙන්;

(5) එහි (5) වන උපවගන්තියේ, “මුල් අධිචෝදනාවේ” යන වචන වෙනුවට “මුල් අධිචෝදනාවේ හෝ මුල් චෝදනාවේ” යන වචන ආදේශ කිරීමෙන් සහ “අලුත් අධිචෝදනාවක්” යන වචන වෙනුවට “අලුත්

අධිචෝදනාවක් හෝ අලුත් චෝදනාවක්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(6) එහි පැති සටහන ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත සඳහන් පැති සටහන ආදේශ කිරීමෙන් :-

''අධිචෝදනා පත්‍රය හෝ චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ (1) වන උපවගන්තිය,-

(1) ''අල්ලස්'' යන වචනය ඉවත් කිරීමෙන්; සහ

(2) ''එහි නම් කර ඇති යම් මහෙස්ත්‍රාත්වරයකුට'' යන වචන වෙනුවට ''අධ්‍යක්ෂ ජනරාල්වරයාට'' යන වචන ආදේශ කිරීමෙන්,

මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ ''(1) මේ පනතේ 2 වන වගන්තියට යටත්ව,'' යන වචන වෙනුවට ''මේ පනතේ 2 වන වගන්තියට යටත්ව,'' යන වචන ආදේශ කිරීමෙන් සහ එහි (අ) ඡේදයේ, ''සියලු රජයේ සේවකයන්ට ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැර පවතින ඔවුන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසට'' යන වචන වෙනුවට ''මේ කොටස අදාළ වන සෑම තැනැත්තකු ම ශ්‍රී ලංකාව තුළ සහ ඉන් බැහැර පවතින ඔවුන්ගේ වත්කම් සහ බැරකම් පිළිබඳ නියමිත ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසට'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය සංශෝධනය කිරීම

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (එ) වන ඡේදයේ ''ලේඛනගත'' යන වචනය වෙනුවට ''උපලේඛනගත'' යන වචනය ආදේශ කිරීමෙන්;

(2) (ඒ) වන ඡේදයේ, ''අමාත්‍යාංශවල සහ රජයේ දෙපාර්තමේන්තුවල මාණ්ඩලික නිලධරයන්'' යන වචන වෙනුවට ''අමාත්‍යාංශවල, රජයේ දෙපාර්තමේන්තුවල සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල මාණ්ඩලික නිලධරයන්;'' යන වචන ආදේශ කිරීමෙන්;

(3) (ග) වන ඡේදයේ, ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ(1)(ඇ) ව්‍යවස්ථාව යටතේ'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) (න) වන ඡේදයේ, ''ලියාපදිංචි වී ඇති වෘත්තිය සමිතිවල විධායක නිලධරයන්'' යන වචන වෙනුවට ''ලියාපදිංචි සාමාජිකයන් සංඛ්‍යාව දහසක් ඉක්මවන ලියාපදිංචි වී ඇති වෘත්තිය සමිතිවල විධායක නිලධරයන්'' යන වචන ආදේශ කිරීමෙන්;

(5) (බ) වන ඡේදයේ, ''විසිපහකට'' යන වචන වෙනුවට ''පනහකට'' යන වචන ආදේශ කිරීමෙන්;

(6) (ම) වන ඡේදයේ, ''කළමනාකරණ හෝ අධීක්ෂණ කටයුතුවල නියැලෙන කාර්ය මණ්ඩලය'' යන වචන වෙනුවට ''සභාපතිවරුන්, අධ්‍යක්ෂකවරුන් සහ මාණ්ඩලික නිලධරයන්'' යන වචන ආදේශ කිරීමෙන්;

(7) (ඇඇ) වන ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''(ඇඇ) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී සහ ජනමාධ්‍ය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලියාපදිංචි කරන ලද මාධ්‍ය සමාගම්වල හිමිකරුවන්, සභාපතිවරුන් සහ අධ්‍යක්ෂවරුන්;''; සහ

(8) (ඈඈ) වන ඡේදයේ, "ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 25 දරන ක්‍රීඩා පනත ප්‍රකාරව පිහිටුවනු ලැබූ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ III වන කොටස යටතේ ලියාපදිංචි කරනු ලැබූ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 81 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (ඇ) වන ඡේදයේ, "වත්කම් සහ බැරකම්;" යන වචන වෙනුවට "වත්කම් සහ බැරකම්; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ඈ) වන ඡේදයේ, "වත්කම් සහ බැරකම්; සහ" යන වචන වෙනුවට "වත්කම් සහ බැරකම්." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (ඉ) වන ඡේදය ඉවත් කිරීමෙන්.

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "පළමු ප්‍රකාශය" යන වචන වෙනුවට "පළමු ප්‍රකාශය සහ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය", යන වචන සහ "ආකෘතියෙන් සිදුකළ යුතු අතර," යන වචනවල සිට "ඒ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු ය:" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට "ආකෘතියෙන් සිදු කරනු ලැබිය යුතු ය:", යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපවගන්තියේ අතුරු විධානයේ "පළමු ප්‍රකාශය" යන වචන වෙනුවට "(1) වන උපවගන්තියේ (අ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති ප්‍රකාශ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියේ (3) වන උපවගන්තියේ, "අයථා පොහොසත්වීමක්" යන වචන වෙනුවට "අයථා පොහොසත්වීමක් හෝ බැඳියාවන් පිළිබඳ සට්ටනයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රේගු දෙපාර්තමේන්තුව" යන වචන වෙනුවට "රේගු දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ, -

(අ) (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) ප්‍රකාශයේ සඳහන් කළ පුද්ගලයන් හඳුනාගැනීමේ කාර්ය සඳහා උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය, විදේශ ගමන් බලපත්‍ර අංකය හෝ අදාළ අධිකාරීන් විසින් පිළිගත් වෙනත් යම් අංකයක්;";

(ආ) (ඇ) ඡේදයේ, "අංක; හෝ" යන වචන වෙනුවට "අංක;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) (ඉ) ඡේදයේ, "විස්තර," යන වචන වෙනුවට "විස්තර; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඊ) මධ්‍යම අධිකාරිය විසින් පුද්ගලයකුගේ රහස්‍යභාවයක් උල්ලංඝනය කරනු ලැබිය හැකි ලෙස සලකනු ලබන නියම කරනු ලබන වෙනත් යම් තොරතුරු,"; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(1අ) (අ) වෙනත් යම් තැනැත්තකුගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක සංස්කරණය කළ පිටපතක් ලබා ගන්නා තැනැත්තකු විසින් 86 වන වගන්තිය යටතේ ඒ ප්‍රකාශය යම් නිලධරයකුට හෝ යම් ආයතනයකට ඉදිරිපත් කිරීමට හැර වෙනත් යම් කාර්යයකට එකී ප්‍රකාශය භාවිත කරනු නොලැබිය යුතු ය.

(ආ) වෙනත් යම් තැනැත්තකුගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක සංස්කරණය කළ පිටපතක් එකී තැනැත්තාගේ රහස්‍යභාවය උල්ලංඝනය කරමින් වෙනත් යම් තැනැත්තකු විසින් භාවිත කරයි නම් එකී තැනැත්තා විසින් වරදක් සිදු කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ වසරක් නොඉක්මවන කාලසීමාවකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය."; සහ

(3) (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(2) මධ්‍යම අධිකාරියේ කටයුතු ආරම්භ කර මාස තුනක කාලසීමාවක් ඇතුළත, මධ්‍යම අධිකාරිය විසින්, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 23 වන වගන්තිය යටතේ එකී පනතේ කාර්යය සඳහා තොරතුරු නිලධරයකු සහ නම් කළ නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.".

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම

"ඡන්ද අපේක්ෂකයන් විසින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම

**89.** 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ප) ඡේදයේ සඳහන් කරන ලද මැතිවරණවල සියලු අපේක්ෂකයන් විසින් වත්කම් සහ බැරකම් ප්‍රකාශයේ පිටපතක් ඒ අපේක්ෂකයාගේ නාමයෝජනා පත්‍ර සමග මැතිවරණ කොමසාරිස්වරයා වෙත භාරදිය යුතු ය.".

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ, "වත්කම් සහ බැරකම් ප්‍රකාශය ලබා දෙනු ලැබිය යුතු" යන වචන වෙනුවට "වාර්ෂික ප්‍රකාශය හෝ පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය ලබා දෙනු ලැබිය යුතු" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියේ, "පරිපාලන දඩ මුදල් පනවනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "පරිපාලන දඩ මුදල් පනවනු ලැබිය යුතු ය. අවස්ථාවෝචිත පරිදි, දඩ මුදල පාරිශ්‍රමිකයේ හෝ විශ්‍රාම ප්‍රතිලාභයේ අධිභාරයක් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (4) වන උපවගන්තියේ, ‘‘තම වත්කම් හා බැරකම් ප්‍රකාශය’’ යන වචන වෙනුවට ‘‘තම වත්කම් හා බැරකම් ප්‍රකාශයේ පිටපතක්’’ යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) එහි (9) වන උපවගන්තියේ, ‘‘(6) වන හෝ (7) වන උපවගන්ති’’ යන වචන සහ ඉලක්කම් වෙනුවට ‘‘(5) වන, (6) වන හෝ (7) වන උපවගන්ති’’ යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තිය සංශෝධනය කිරීම

**14**. ප්‍රධාන ප්‍රඥප්තියේ 91 වන වගන්තියේ ‘‘මේ පනතේ I වන කොටස යටතේ’’ යන වචන සහ ඉලක්කම වෙනුවට ‘‘මේ පනත යටතේ’’ යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය සංශෝධනය කිරීම

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ ‘‘වියදම් සහ පොලී මුදල්’’ යන වචන වෙනුවට ‘‘වියදම් සහ බැඳියාවන්’’ යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 111 වන වගන්තිය සංශෝධනය කිරීම

**16**. ප්‍රධාන ප්‍රඥප්තියේ 111 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් සහ එකී උපවගන්ති ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ලෙස අංකනය කිරීමෙන්:-

‘‘(2) (1) වන උපවගන්තිය යටතේ තැනැත්තකු වරදකරුවකු වූ විට, ඒ උපවගන්තිය යටතේ දඩ මුදලක් නියම කිරීමට අමතරව ඒ දූෂණයෙන් උත්පාදිතයක් වන අත්කරගත් හෝ මාරු කළ යම් දේපළක වටිනාකමින් තුන් ගුණයකට නොඅඩු

දණ්ඩනයක් හෝ ඒ දූෂණය හේතුවෙන් රජයට වී ඇති යම් අලාභයක් වේ නම් අධිකරණය අලාභය ලෙස නිශ්චය කරන ප්‍රමාණය හෝ ගෙවන ලෙසට නියම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ නියම කරන ලද යම් දණ්ඩනයක් අධිකරණය විසින් නියම කරන ලද දඩ මුදලක් ලෙස අයකර ගනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ වෙනත් යම් විධිවිධානයකට පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් රජයේ නිලධරයකු (1) වන උපවගන්තිය යටතේ වූ දූෂණ වරදකට වරදකරු වන අවස්ථාවක දී, එම දූෂණ ක්‍රියාවේ ප්‍රතිඵලයක් ලෙස එම රජයේ නිලධරයා විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් අත්කරගෙන ඇත්තාවූ ද එම දූෂණ ක්‍රියාව සිදු කළ දිනයේ දී එම නිලධරයා විසින් හෝ එම වෙනත් යම් තැනැත්තා විසින් අඛණ්ඩව භුක්ති විඳිමින් සිටිනු ලබන්නා වූ ද (දේපළ හැර) යම් ප්‍රදානයක්, පත්වීමක්, ප්‍රතිලාභයක් හෝ අස්පෘශ්‍ය ස්වභාවයේ වාසියක්, එම දිනයට පෙරාතුව ඉටුකරන ලද යම් නිල කටයුතුවලට අගති විරහිතව, එම වරදට වරදකරු කරනු ලබන දිනයේ සිට නීත්‍යානුකූල වීම අවසන් වන්නේ ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තිය සංශෝධනය කිරීම*

**17**. ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

“(1) 1997 අංක 30 දරන ඇප පනතේ විධිවිධාන ප්‍රකාරව මේ පනත යටතේ වන සියලු වැරදි සංඥෙය සහ ඇප දිය නොහැකි වැරදි විය යුතු ය:

එසේ වුව ද, රුපියල් ලක්ෂයකට වඩා නොඅඩු අල්ලසක් ඉල්ලා සිටීම, පිළිගැනීම සහ පිරිනැමීම පිළිබඳව සැක කරනු ලබන හෝ චෝදනා කරනු ලබන තැනැත්තකු හෝ දූෂණ වරද සිදු කිරීමෙන් රජයට රුපියල් ලක්ෂ පහකට නොඅඩු පාඩුවක් සිදු කරන ලද හෝ තමාට හෝ වෙනත් යම් තැනැත්තකුට රුපියල් ලක්ෂ පහකට නොඅඩු ප්‍රතිලාභයක්, අනුග්‍රහයක් හෝ වාසියක් අත් කරගෙන ඇති, එකී වටිනාකම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන සහතිකයක් මගින් ස්ථිර කරනු ලැබ ඇති විට ඒ සැකකරු හෝ චූදිතයා වෙත මහාධිකරණයක් විසින් විශේෂ අවස්ථානුගත කාරණාවක දී හැර ඇප ලබා දෙනු නොලැබිය යුතු ය.''.

**18**. ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ''රජයේ සේවකයා'' යන අර්ථ නිරූපණයේ ''සියයට විසිපහකට වැඩි ප්‍රමාණයක්'' යන වචන වෙනුවට ''සියයට පනහකට නොඅඩු ප්‍රමාණයක්'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) ''උපලේඛනගත ආයතනය'' යන අර්ථ නිරූපණයේ ''සියයට විසිපහකට නොඅඩු කොටස්'' යන වචන වෙනුවට ''සියයට පනහකට නොඅඩු කොටස්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ''මාණ්ඩලික නිලධරයා'' යන අර්ථ නිරූපණයේ ''රාජ්‍ය සංස්ථාවක යම් සේවානියුක්තයකු'' යන වචන වෙනුවට ''කොටස්වලින් සියයට පනහකට නොඅඩු ප්‍රමාණයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් දරනු ලබන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමාගමක යම් සේවානියුක්තයකු'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**19**. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (2) වන උපවගන්තියේ (ඉ) වන ඡේදයේ (i) වන අනුඡේදයේ, "වසර විස්සක්" යන වචන වෙනුවට "වසර දහයක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(2අ) 2023 සැප්තැම්බර් මස 15 දින සිට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය දක්වා වූ කාලපරිච්ඡේදය අතරතුර කොමිෂන් සභාවට බඳවාගත් සෑම නිලධරයකු සහ සේවකයකු ම, 2023 සැප්තැම්බර් මස 15 දිනට පෙර හිස්ව තිබූ සහ සේවා අවශ්‍යතා පදනමින් 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ ඒ ධුර සඳහා කොමිෂන් සභාව ඔවුන් බඳවා ගනු ලබන අවස්ථාවේ දී හිමිව තිබූ රැකියා නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන නියම සහ කොන්දේසි යටතේ කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔවුන් විසින් මේ පනත ක්‍රියාත්මක වීමෙන් මාස තුනක් ඇතුළත කොමිෂන් සභාවේ සේවයේ රැඳී සිටීමට තීරණය කරන්නේ ද යන්න කොමිෂන් සභාවට දන්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද -

(i) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) (i) වන ඡේදයේ විධිවිධාන කොමිෂන් සභාවේ සේවයේ රැඳී සිටිනු ලැබිය හැකි එවැනි යම් නිලධරයකුගේ හෝ සේවකයකුගේ විශ්‍රාම වැටුප හෝ වෙනත් ප්‍රතිලාභ ගණනය කිරීමේ කාර්යය සඳහා අදාළ කර ගනු ලැබිය යුතු ය; සහ

(ii) මේ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) (ii) වන ඡේදයේ විධිවිධාන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පසු කොමිෂන් සභාවේ එවැනි යම් නිලධරයකු හෝ සේවකයකු සේවය අතහැරීමට තීරණය කරනු ලබන අවස්ථාවේ දී එකී නිලධරයාට හෝ සේවකයාට අදාළ විය යුතු ය.”.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**20**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.